# PHYSICAL CHEMISTRY

# කලාප සමතුලිතතාවය

## *Partition coefficient*




**SASINTHA MADHUSHAN**

BSc (SP)

0712470326

**විභාග සංගුණකය $K_d$**

විභාග සංගුණකය යනු ද්‍රාව්‍ය විශේෂයක්, අමිශ්‍ය ද්‍රව දෙකක් අතර ව්‍යාප්ත වීමට අදාළ සමතුලිතතා නියතය යි.

අමිශ්‍ය ද්‍රව දෙකක් මිශ්‍රකල විට

..............................................................................................................................................................................

..............................................................................................................................................................................

..............................................................................................................................................................................

............................................................................................

..............................................................................................................................................................................

............................................................................................

ද්‍රව දෙකෙහිම මිශ්‍ර ද්‍රාව්‍යයක් ද්‍රව ස්ථර වල මිශ්‍ර වීමට ඉඩ හැරිය විට

..............................................................................................................................................................................

..............................................................................................................................................................................

..............................................................................................................................................................................

..............................................................................................................................................................................

.......................................................................................................................................................

**<u>නන්ස්ට් නියමය</u>**

..............................................................................................................................................................................

..............................................................................................................................................................................

..............................................................................................................................................................................

..............................................................................................................................................................................

...................................................... ........................................................................................................................

මෙම නියමය යෙදීමට,

- ..................................................................................................................................................................
  ..........................................................................................................
- ..................................................................................................................................................................
  ..........................................................................................................
- ..................................................................................................................................................................
  ..........................................................................................................
- ..................................................................................................................................................................
  ..........................................................................................................

1. ජලය සමග අමිශ්‍ර $CHCl_3$ හා ජලය අතර $NH_3$ කාමර උෂ්ණත්වයේදී ව්‍යාප්ත වීමට ඉඩ හරින ලදී. සමතුලිතතාවය ඇතිවූ පසු ජලීය ද්‍රාවණයෙන් $10\ cm^3$ ක් වෙන් කරගෙන $0.02\ moldm^{-3}$, $HCl$ සමග අනුමාපනය කරන ලදී. මෙවිට බියුරෙට්ටු පාඨාංකය $22.5\ cm^3$ විය. $CHCl_3$ ස්ථරයේ $20\ cm^3$ ක් $0.05\ moldm^{-3}$, $HCl$ සමග අනුමාපනය කල විට බියුරෙට්ටු පාඨාංකය $20\ cm^3$ විය. ඉහත දත්ත උපයෝගී කරගෙන $CHCl_3$ හා ජලය අතර $NH_3$ හි ව්‍යාප්ත සංගුණකය සොයන්න.

2. $2\ moldm^{-3}$ ජලීය $NH_3$ ද්‍රාවණයකින් $50\ cm^3$ ක් හා $CHCl_3$, $50\ cm^3$ ක් $25\ ℃$ දී ව්‍යාප්ත වීමට ඉඩ හරින ලදී. සමතුලිතතාවය ඇතිවූ පසු $CHCl_3$ ස්ථරයේ $20\ cm^3$ ක් $0.05\ moldm^{-3}$, $HCl$ සමග අනුමාපනය කල විට බියුරෙට්ටු පාඨාංකය $18\ cm^3$ විය. ඉහත දත්ත උපයෝගී කරගෙන $25\ ℃$ දී $CHCl_3$ හා ජලය අතර $NH_3$ හි ව්‍යාප්ත සංගුණකය සොයන්න.

3. ජලය සමග අමිශ්‍ර කාබනික ද්‍රාවකයක් හා ජලය අතර බ්‍රෝමීන් කාමර උෂ්ණත්වයේදී ව්‍යාප්ත වීමට ඉඩ හරින ලදී. සමතුලිතතාවය ඇතිවූ පසු දුඹුරු පැහැති ජලීය ද්‍රාවණයෙන් $10\ cm^3$ ක් වෙන් කරගෙන එය අවර්ණ වන තුරු ජලීය $SO_2$ ද්‍රාවණයක් එකතු කරන ලදී. ඉන්පසු අවර්ණ ද්‍රාවණය නටවා ඉතිරිව ඇති $SO_2$ සම්පූර්ණයෙන් ඉවත් කර එයට මෙතිල් ඔරේන්ජ් බින්දු කිහිපයක් දමා $0.01\ moldm^{-3}$, $NaOH$ සමග අනුමාපනය කරන ලදී. මෙවිට බියුරෙට්ටු පාඨාංකය $16.7\ cm^3$ විය.
තැඹිලි පැහැති කාබනික ස්ථරයේ $2\ cm^3$ කට ද ඉහත ආකාරයෙන්ම අවර්ණ වන තුරු ජලීය $SO_2$ ද්‍රාවණයක් එකතු කර ඉන්පසු අවර්ණ ද්‍රාවණය නටවා ඉතිරිව ඇති $SO_2$ සම්පූර්ණයෙන් ඉවත් කර එයට මෙතිල් ඔරේන්ජ් බින්දු කිහිපයක් දමා $0.05\ moldm^{-3}$, $NaOH$ සමග අනුමාපනය කල විට බියුරෙට්ටු පාඨාංකය $30\ cm^3$ විය.
ඉහත දත්ත උපයෝගී කරගෙන කාබනික ද්‍රාවකය හා ජලය අතර බ්‍රෝමීන් හි ව්‍යාප්ත සංගුණකය සොයන්න.
**සැ යු:** $SO_{2(aq)} + Br_{2(aq)} + 2H_2O_{(l)} \longrightarrow H_2SO_{4(aq)} + 2HBr_{(aq)}$
ඉතිරිව ඇති $SO_2$ ඉවත් කිරීමේදී $HBr$ ඉවත් නොවන බවද, $H_2SO_4$ මගින් $HBr$ ඔක්සිකරණය නොවන බවද උපකල්පනය කරන්න.

4. $CS_2$ හා ජලය අතර $I_2$ කාමර උෂ්ණත්වයේදී ව්‍යාප්ත වීමට ඉඩ හරින ලදී. සමතුලිතතාවය ඇතිවූ පසු ජලීය ද්‍රාවණයෙන් $10\ cm^3$ ක් වෙන් කරගෙන $0.02\ moldm^{-3}, Na_2S_2O_3$ සමග අනුමාපනය කරන ලදී. මෙවිට බියුරෙට්ටු පාඨාංකය $12.5\ cm^3$ විය. $CS_2$ ස්ථරයේ $5\ cm^3$ ක් $0.05\ moldm^{-3}, Na_2S_2O_3$ සමග අනුමාපනය කල විට බියුරෙට්ටු පාඨාංකය $25\ cm^3$ විය.
   a. ඉහත දත්ත උපයෝගී කරගෙන $CS_2$ හා ජලය අතර $I_2$ හි ව්‍යාප්ත සංගුණකය සොයන්න.
   b. එක්තරා $I_2$ ප්‍රමාණයක්, $CS_2$ හා සාන්ද්‍රණය $0.3\ moldm^{-3}$ වන ජලීය $KI$ ද්‍රාවණයක් සමග සොලවා ඉහත උෂ්ණත්වයේදීම සෑහෙන වේලාවක් තිබෙන්නට හරින ලදී. ඉන් පසු $Na_2S_2O_3$ ද්‍රාවණයක් සමග එක් එක් ස්ථරය අනුමාපනය කිරීමෙන් එම ස්ථර වල දියවී ඇති $I_2$ ප්‍රමාණ නිර්ණය කරන ලදී.
   එහිදී $CS_2$ ස්ථරයේ $10\ cm^3$ ක් $0.1\ moldm^{-3}, Na_2S_2O_3$ සමග අනුමාපනය කල විට බියුරෙට්ටු පාඨාංකය $45\ cm^3$ විය.
   ජලීය ස්ථරයේ $100\ cm^3$ ක් $0.05\ moldm^{-3}, Na_2S_2O_3$ සමග අනුමාපනය කල විට බියුරෙට්ටු පාඨාංකය $100\ cm^3$ විය.
   $I_2 + I^- \rightleftharpoons I_3^-$ යන ප්‍රතික්‍රියාව සඳහා මෙම පරීක්ෂණය සිදු කරන උෂ්ණත්වයේදී සමතුලිතා නියතය ගණනය කරන්න.

**<u>ද්‍රවයක් තුල වායුවක ද්‍රාව්‍යතාවය</u>**

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

..........................................................................................................................................................................................................

........................................ .........................................................................................................................

උදාහරණ

*** හෙන්රි නියමය**

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

..............................................................................................................................................................................

**5.** $37\ ^{\circ}C$ දී හා $0.8\ atm$ හි රුධිරය තුල $N_2$ වල ද්‍රාවHතාව $5.6 \times 10^{-4}\ moldm^{-3}$ වේ. කිමිදුම් කරුවෙක් $N_2$ වල ආංශික පීඩනය $4\ atm$ වූ සම්පීඩිත වායුව ආශ්වාස කරයි. මුළු රුධිර පරිමාව $5\ dm^3$ නම් කිමිදුම් කරු ජලය මතුපිටට පැමිණි විට නිදහස් වන $N_2$ ප්‍රමාණය සොයන්න.
(ජලය මතුපිට උෂ්ණත්වය $37\ ^{\circ}C$ යැයි ද වායුගෝලයේ $N_2$ වල ආංශික පීඩනය $0.8\ atm$ යැයි ද සලකන්න)

**6.** $0.1\ moldm^{-3}$ ජලීය $NH_3$ ද්‍රාවණයකින් $20\ cm^3$ ක් හා $0.1\ moldm^{-3}$ ජලීය $CuSO_4$ ද්‍රාවණයකින් $20\ cm^3$ ක් ද මිශ්‍ර කරන ලදී ඉන් පසු එයට $CHCl_3$, $75\ cm^3$ ක් එක් කර $25\ ^{\circ}C$ දී ව්‍යාප්ත වීමට ඉඩ හරින ලදී. සමතුලිතතාවය ඇතිවූ පසු $CHCl_3$ ස්ථරයේ $50\ cm^3$ ක් $0.1\ moldm^{-3}$, $HCl$ සමග අනුමාපනය කල විට බියුරෙට්ටු පාඨාංකය $23\ cm^3$ විය. ඉහත දත්ත උපයෝගී කරගෙන $25\ ^{\circ}C$ දී ජලය හා $CHCl_3$ අතර $NH_3$ හි ව්‍යාප්ත සංගුණකය 25 කි.

a. ජලීය ස්ථරයේ නිදහස් $NH_3$ සාන්ද්‍රනය
b. $Cu^{2+}$ සමග සංගත $NH_3$ සාන්ද්‍රනය
c. සංගත සංකීර්ණයේ එක් $Cu^{2+}$ අයනයකට සම්බන්ධ $NH_3$ අණු ගණන

**7.** ජලය සමග අමිශ්‍ර $B$ කාබනික ද්‍රාවකය හා ජලය අතර $HA$ දුබල අම්ලය කාමර උෂ්ණත්වයේදී ව්‍යාප්ත වේ. නමුත් $B$ තුලදී $HA$ සංසට්ටනයට හෝ විඝටනයට භාජනය නොවේ.
$0.05\ moldm^{-3}$ ජලීය $HA$ ද්‍රාවණයකින් $100\ cm^3$ ක් හා $B$, $50\ cm^3$ ක් $25\ ^{\circ}C$ දී ව්‍යාප්ත වීමට ඉඩ හරින ලදී. සමතුලිතතාවය ඇතිවූ පසු ජලීය ස්ථරයේ $p^H$ අගය 4 විය. $25\ ^{\circ}C$ දී $HA$ විඝටන නියතය $1 \times 10^{-7} M$ වේ.

a. ජලීය ස්ථරයේ $H^+$ සාන්ද්‍රනය
b. ජලීය ස්ථරයේ $HA$ සාන්ද්‍රනය
c. $B$ ස්ථරයේ $HA$ සාන්ද්‍රනය
d. ජලය හා $B$ අතර $HA$ හි ව්‍යාප්ත සංගුණකය
e. ජලීය ස්ථරයේ $HA$ හී විඝටන ප්‍රමාණය

**8.** ජලය සමග අමිශ්‍ර $CHCl_3$ කාබනික ද්‍රාවකය හා ජලය අතර $HA$ දුබල අම්ලය කාමර උෂ්ණත්වයේදී ව්‍යාප්ත වේ. නමුත් $CHCl_3$ තුලදී $HA$ සංසට්ටනයට හෝ විඝටනයට භාජනය නොවේ.
$0.087\ moldm^{-3}, HA$ සාන්ද්‍රනය ඇති $CHCl_3$ ද්‍රාවණයකින් $500\ cm^3$ ක් හා ජලය $500\ cm^3$ ක් $27\ ^{\circ}C$ දී ව්‍යාප්ත වීමට ඉඩ හරින ලදී. සමතුලිතතාවය ඇතිවූ පසු ජලීය ස්ථරයේ $p^H$ අගය 3.5 විය. $27\ ^{\circ}C$ දී $HA$ විඝටන නියතය $8 \times 10^{-6} M$ වේ.

a. $27\ ^{\circ}C$ දී ජලය හා $CHCl_3$ අතර $HA$ හි ව්‍යාප්ත සංගුණකය සොයන්න
b. වෙනත් පරීක්ෂණයකදී $0.087\ moldm^{-3}, HA$ සාන්ද්‍රනය ඇති $CHCl_3$ ද්‍රාවණයකින් $500\ cm^3$ ක් හා $0.037\ moldm^{-3}$ ජලීය $NaOH, 500\ cm^3$ ක් $27\ ^{\circ}C$ දී ව්‍යාප්ත වීමට ඉඩ හරින ලදී. සමතුලිතතාවය ඇතිවූ පසු ජලීය ස්ථරයේ $p^H$ අගය සොයන්න


Chemistry 48